# රාජ්‍ය දැව සංස්ථාව

## පරිසර අමාත්‍යාංශය

## 2026 වසර සඳහා දැවමය ගෘහ භාණ්ඩ, දැව ආශ්‍රිත නිෂ්පාදන හා දැවමය කලාත්මක නිර්මාණ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

**රාජ්‍ය දැව සංස්ථාව 2026 වර්ෂයට අදාළව පහත සඳහන් ප්‍රධාන දැවමය කාණ්ඩ සඳහා සැපයුම්කරුවන් වශයෙන් ලියාපදිංචි වීමට කැමති නිෂ්පාදනකරුවන්, නියෝජිතයන්, ආනයනකරුවන් ලියාපදිංචි කරනු ලැබේ.**

- **දැවමය ගෘහ භාණ්ඩ**
- **දැවමය ආශ්‍රිත නිෂ්පාදන**
- **දැවමය කලාත්මක නිර්මාණ**

**බිම් ඇතුරුම් ලෑලි, බිත්ති ඇතුරුම් ලෑලි හා වෙනත් දැව ආශ්‍රිත නිෂ්පාදන**

දැව භාණ්ඩ වල ප්‍රමිතිය තහවුරු කිරීම සඳහා සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි වන සැපයුම්කරුවන් වෙත නියම කරන අවස්ථාවලදී රාජ්‍ය දැව සංස්ථාවේ දැව යොදා ගනිමින් දැව භාණ්ඩ නිෂ්පාදනය කර සැපයීම සඳහා ප්‍රමුඛ අවධානය යොමුකළ යුතු අතර, රාජ්‍ය දැව සංස්ථාව මගින් ලබාදෙන ප්‍රමිතිමාන අනුගමනය කළ යුතුය.

### අයදුම්පත් භාරදීම

A. අයදුම්පත් නිකුත් කරන අවසන් දිනය හා වේලාව : 2026.06.16 දින ප.ව. 3.00 දක්වා වේ.

B. සම්පූර්ණ කරන ලද අයදුම්පත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි), රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026.06.26 දින පෙ.ව. 11.30 ට පෙර එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ ඉහළ වම්පස 2026 වසර සඳහා දැවමය ගෘහ භාණ්ඩ, දැවමය නිෂ්පාදන හා දැවමය කලාත්මක නිර්මාණ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම යනුවෙන් සඳහන් කළ යුතුය.

C. සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ අයදුම්පත් අවශ්‍ය සැපයුම්කරුවන් විසින් අදාළ ආයතනයේ ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු අතර, සතියේ වැඩ කරන දිනයන්හිදී ආපසු නොගෙවන ලංසු පත්‍රිකා ගාස්තු ලෙස රු. 500/- ක් ගෙවා 2026.06.16 දින දක්වා රාජ්‍ය දැව සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි), රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල වෙතින් ලබා ගත හැකිය. මීට අමතරව රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාල මගින් ද අදාළ අයදුම්පත් ලබා ගත හැකිය.

D. පහත සඳහන් කරුණු සම්පූර්ණ කළ හැකි සැපයුම්කරුවන්ට අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

- අලෙවියෙන් පසු සේවා සැපයීම
- දිවයින පුරා නොමිලේ ප්‍රවාහනය කිරීම
- භාණ්ඩා නොමිලේ ස්ථානගත කිරීම
- අවශ්‍ය විට සැපයුම්කරු විසින් නිෂ්පාදන සහතික ලබාදිය යුතුය
- කඩිනමින් ප්‍රතිචාර දැක්වීම
- භාණ්ඩ ඇණවුම්කර දින 7 ක් තුළ භාණ්ඩ සැපයීම. (තොග ඇත්නම්)
- දිගුකාලීනව ස්ථාවර මිලක් ලබා දීමේ හැකියාව
- දිගුකාලීනව ණය පහසුකම් ලබා දීමේ හැකියාව
- රාජ්‍ය දැව සංස්ථාවේ බත්තරමුල්ල, රත්මලාන, බූස්ස, පල්ලේකැලේ, නුවරඑළිය, තලල්ල, බණ්ඩාරවෙල හා රත්නපුර ඇතුළු ප්‍රදර්ශනාගාර වල සාම්පල් ප්‍රදර්ශනය කිරීමේ හැකියාව

E. ලියාපදිංචි සැපයුම්කරුවන් මගින් මිල ගණන් කැඳවනු ලැබේ.

F. අයදුම්පත පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම රාජ්‍ය දැව සංස්ථාව සතුවේ.

G. වැඩිදුර විස්තර හා පැහැදිලි කරගැනීම් සඳහා 0772500476 අංකය මගින් කසුන් මහතා අමතන්න.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) - 011-2866636 / වෙබ් අඩවිය - www.timco.lk**

**ජාතියේ විශ්වාසනීය දැව සැපයුම්කරු**

**සාමාන්‍යාධිකාරී - රාජ්‍ය දැව සංස්ථාව**